**බුද්ධශාසන අරමුදලේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති** වාර්තාව **- 2024**

**------------------------------------------------------------------------------------**

බුද්ධශාසන අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍වයක් විසින්ම එම අස්තිත්‍වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්‍වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දැක්විය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්තිත්‍වවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්‍වයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වග බලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම**

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2022, 2023 හා 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2. විගණන නිරීක්ෂණ**

**2.1 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2024 මැයි 22 දින පැවති 89 වන පාලක මණ්ඩල රැස්වීමේදී පත්‍රිකා අංක 89/16 මඟින් භික්ෂු වෛද්‍යාධාර ක්‍රමය යටතේ භික්ෂූන් සහ දස සිල් මාතාවන් 23 දෙනෙකුට 2024 ජූනි සිට දෙසැම්බර් දක්වා මාසයකට රු.5,000 බැගින් ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, අදාළ ලේඛනයේ ඇතුළත් 17 දෙනෙකුට අනුමැතියකින් තොරව | මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් තෝරා ලේඛණගත කර පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු ලේඛණගත කරන ලද මස සිට ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගනු ලබයි. 2024 මැයි සිට භික්ෂූන් වහන්සේලා තෝරාගෙන ඇති නමුත් 2024 ජූනි මස සිට ගෙවීම් කිරීමට අනුමැතිය ලබා ගෙන තිබුණද ගෙවීම් මැයි මස | දීමනා ගෙවීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වීම. |

| | |
|---|---|
| රු.5,000 බැගින් රු.85,000ක් මැයි මස සඳහා ද ගෙවීම් කර තිබුණි. | සිට කර ඇති බැවින් එම ගෙවීම මෙම වර්ෂයේ ගෙවීම් වලින් අඩුකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. |

## 2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 264(1) ප්‍රකාරව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත්, 2024 වසරේදී අරමුදල විසින් ගෙවීම් කර තිබූ වවුචර් 141ක් සම්බන්ධයෙන් අදාළ රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 48,139,056 | ලදුපත් | ඉදිරියේදී සියලු ගෙවීම් ලැබුණු බවට සහතිකයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස නිලධාරින් වෙත දැනුම් දෙන ලද බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 264(1) ප්‍රකාරව සෑම ගෙවීමක් සඳහාම සනාථන ලබා ගත යුතු වීම. |

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 2.3.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ කාර්ය මණ්ඩලයෙන් පරිබාහිර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ බුද්ධශාසන අංශයට අනුයුක්තව සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 13කදී එකතු වටිනාකම රු.1,000,000ක් වූ අත්තිකාරම් මුදල්, අරමුදලේ කාර්යයන් වෙනුවෙන් ලබාදී තිබුණි. | මාණ්ඩලික නිලධාරින් දෙදෙනෙකු පමණක් සිටින බැවින් උපරිම අත්තිකාරම් මුදල් ලබා ගැනීම ලක්ෂ 2 කට සීමාවන්නට සිදු වී ඇති අතර, එම මුදල සමහර වැඩසටහන්වලදී ප්‍රමාණවත් නොවීම මත අරමුදල අයත් වන බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් මඟින් අත්තිකාරම් මුදල් ලබා ගත් අතර, ඉදිරියේදී මෙම තත්ත්වය අවම කර ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | අදාළ වගකීම් නොපැවරෙන නිලධාරීන් වෙත අත්තිකාරම් මුදල් නොගෙවිය යුතු වීම |

**2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරීත්ව යේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය | අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු වුවද 2024 වර්ෂයේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයට අදාල පොදු ලෙජර ඇතුලු අදාල ගිණුම් අඩුපාඩු ඉදිරියේදී සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ. 135 | 2024 වර්ෂය සඳහා අරමුදලේ මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම සිදු කර නොතිබුණි. | මු.රෙ. 135 යටතේ 2025 මුදල් පාලන සම්බන්ධයෙන් කාර්යයන් පවරාදීම සිදු කිරීමට නියමිත බව දන්වා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතු වීම |
| | (ii) මු.රෙ. 395 | 2024 වර්ෂයට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශ 2025 ඔක්තෝබර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සිදු කර නොතිබුණි. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතු වීම |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත හා ප්‍රකාශිත මුදල් රෙගුලාසි | | | |
| | (i) මු.රෙ. 877(2) (ඇ) යටතේ වන මාර්ගෝපදේශ 04 හි 1 වගන්තිය | ව්‍යවස්ථාපිත අරමුදලකට ලැබෙන සියළුම ලැබීම් හා එම අරමුදලෙන් සිදු කරන ගෙවීම් විධිමත්ව මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන සුදුසු උපයෝගී ලෙජර් පොත්වල, මූලික පොත්වල සහ ලෙජර් ගිණුම්වල සටහන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ රු.80,406,085ක් ආදායම් සහ රු.60,574,208ක් වූ වියදම් වලට අදාල ගනුදෙනු සටහන් | 2024 වර්ෂයට අදාල පොදු ලෙජර් ඇතුලු අදාල ගිණුම් අඩුපාඩු ඉදිරියේදී සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතු වීම |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම සඳහා ද්විත්ව සටහන් ක්‍රමයට පොදු ලෙජරය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | | |
| (ii) | මු.රෙ. 877(2) (ඇ) යටතේ වන මාර්ගෝපදේශ 04 හි 3 වගන්තිය | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තා (බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රගතිය පිළිබඳ කාර්තුමය වාර්තා, අයවැය ඉලක්ක ලඟාවීම පිළිබඳ වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අදාල කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තා) සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ද පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී කාර්තුමය වාර්තා සකස් කර යොමු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කළ යුතු වීම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරන අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුද්ධශාසන අරමුදල විසින් භාවිතා කරනු ලබන වත්කම් අතරින් ඇතැම් වත්කම් අරමුදල විසින් මිලදී ගෙන තිබූ අතර ඇතැම් වත්කම් අමාත්‍යාංශය සතු වේ. ඒ අනුව, අරමුදල විසින් මිලදී ගත් වත්කම් සහ බුද්ධශාසන අමාත්‍යාංශය සතු වත්කම් වෙන්කර හඳුනා ගෙන නොතිබුණද රු. 8,014,031ක් වූ වත්කම් අරමුදලේ වත්කම් වශයෙන් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර තිබුණි. | 2024 වාර්ෂික කෙටුම්පත් වාර්තාව බුද්ධශාසන අරමුදලේ වත්කම් පමණක් ඇතුළත් කර සංශෝධනය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | එක් එක් අස්ථිත්වයට අයත් වත්කම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන සටහන් කළ යුතු වීම. |
| (ආ) | බුද්ධශාසන අරමුදල සතුව පැවති අනුරාධපුර අනුලා මාවතේ පිහිටි සුබසිංහ වලව්ව සහ ඉඩම 2024 ජුනි 18 දිනැති අංක 94 දරන පූජා ඔප්පුව මඟින් අනුරාධපුර ථූපාරාම විහාරස්ථානය වෙත පූජා කර තිබූ නමුත් 2024 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය යටතේ 2024 දෙසැම්බර් 31 දිනට අදාළ ඉඩම හා වලව්ව අරමුදලේ වත්කම් වශයෙන් පෙන්නුම් කර තිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට කාර්යසාධන ලේඛනයෙන් සුබසිංහ වලව්ව සහ ඉඩම ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | නිවැරදි තොරතුරු ඇතුළත් කර කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බුද්ධශාසන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ තුළ වසර 15ක් පුරා සුනාමි ආධාර ලෙස ඉදිරියට ගෙන එනු ලබන රු.1,384,796ක් වන හිමිකම් ශේෂය බුද්ධශාසන අරමුදල් ගිණුමට බැරකරන ලෙස 89 වන පාලක මණ්ඩල රැස්වීම මගින් අනුමැතිය ලබාදී තිබුණද මේ සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පාලක මණ්ඩල නිර්දේශ අනුව අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 1990 අංක 35 දරන බුද්ධ ශාසන අරමුදල් පනතේ 11(අ) උප වගන්තිය අනුව අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සෙවකයන් පත් කිරීම සිදුකළ යුතු වේ. ඒ අනුව කාර්යමණ්ඩලයන් අනුමත කරවාගෙන තිබුණද, ස්ථිර වශයෙන් එක් තනතුරක් සඳහා පමණක් බඳවාගෙන තිබූ අතර අනෙකුත් තනතුරු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. තවද, තවත් නිලධාරියෙකුට අරමුදලේ රාජකාරි පැවරීම් සිදු කර තිබූ අතර අරමුදලට අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙලෙස අනුයුක්ත කිරීමේදී ද ගිණුම් කටයුතු පිළිබඳ දැනුමැති නිලධාරියෙක් අනුයුක්ත නොකිරීමත්, ගණකාධිකාරීවරයෙකුගේ නිසි මගපෙන්වීම් නොතිබීමත් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවද විගණනයට නිරීක්ෂණය විය. | ලේකම්, ගණකාධිකාරි හා අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ නිලධාරීන් අනුයුක්ත කර ඇත. බුද්ධශාසන අරමුදල වෙනුවෙන් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය සම්පූර්ණ කිරීමට ඉදිරි කටයුතු කරමින් පවතින බවත්<br>සම්පූර්ණ කාර්ය මණ්ඩලය ස්ථිර ලෙස බඳවා ගෙන ගෙවීම් කිරීමට සිදුවුවහොත් වාර්ෂික ආදායමෙන් (රුපියල් මිලියන 70ක පමණ) 10% වඩා වැඩි මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවීමට සිදු වන බවත් දන්වා තිබුණි. පූර්ණ කාලීන ගණකාධිකාරිවරයෙකු නොමැති වීම හා ගිණුම් විෂය සම්බන්ධ දැනුමැති නිලධාරියකු නොමැති වීම හේතුවෙන් මෙම ගිණුම් සම්බන්ධ වාර්තා සකස් කිරීමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි. | පනතේ අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීමත් ගිණුම් කටයුතු පිළිබඳ අවබෝධයක් ඇති නිලධාරියෙකු අරමුදලට පත් කර ගත යුතු වීම. |
| (ඉ) | 2024 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව තුළ කැපකරු ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ සාමණේර භික්ෂූන් සහ ශිෂ්‍ය දසසිල් මාතාවන් 1000 ක් සඳහා මසකට රු.2,000 බැගින් ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩසටහනක් හඳුනාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ජනාධිපති අරමුදල විසින් පිරිවෙන් අධ්‍යාපනය ලබන සාමණේර වහන්සේලා සහ සිල්මාතාවන් සඳහා 2024 මැයි මස සිට රු.6000/= ක මාසික ශිෂ්‍යාධාර මුදලක් ලබා දීම ආරම්භ කර ඇති බැවින්, එම වැඩසටහන පිළිබඳව සොයා එම ශිෂ්‍යත්ව වැඩසටහන් යටතේ ප්‍රතිලාභ නොලබන ස්වාමීන් වහන්සේලා සඳහා පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍යාධාර ලබා දීම සලකා බැලීම පිණිස හෝ අයෙකුට ශිෂ්‍යාධාර දෙකක් නොලැබෙන බව තහවුරු කර ගනිමින් පසු ශිෂ්‍යාධාර ගෙවීම සඳහා ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලද බවත්,<br>ඒ අනුව, 92 වන පාලක මණ්ඩලයේදී ලබා දුන් අනුමැතිය පරිදි 2025 ජූලි මස සිට නැවත මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද බවත් දන්වා තිබුණි. | වර්ෂය තුළදී කිරීමට සැලසුම් කරන ලද වැඩසටහන් ඒ ආකාරයට සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 138(2) අනුව යම් ගෙවීමක් හේතු කරගෙන පවත්නා මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල ඉක්මවා යාමක් සිදු නොවන බව සහ අදාළ ලෙජරයේ සටහන් කර ඇති බව සහතික කරන නිලධාරියා විසින් සනාථ කර ගැනීමෙන් පසුව අදාළ සහතික කිරීම් කළ යුතු වුවද අරමුදලේ ගෙවීම් ප්‍රධාන ලෙජරයේ අදාළ ගිණුමට සටහන් කර නොතිබියදී ගෙවීම් සහතික කර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයට අදාළ ලෙජර් හා ජර්නල් ආදිය, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව මූල්‍ය ප්‍රකාශන, ලෙජර් හා ජර්නල් සකස් කල යුතු බවත් පූර්ණ කාලීන ගණකාධිකාරිවරයෙකු නොමැති වීම හා ගිණුම් විෂය සම්බන්ධ දැනුමැති නිලධාරියකු නොමැති වීම හේතුවෙන් මෙම ගිණුම් සම්බන්ධ වාර්තා සකස් කිරීමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව යම් ගෙවීමක් හේතුකොටගෙන පවත්නා මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල ඉක්මවා යාමක් සිදු නොවන බව සහ අදාළ ලෙජරයේ සටහන් කර ඇති බව සහතික කරන නිලධාරියා විසින් සනාථ කර ගැනීමෙන් පසුව අදාළ සහතික කිරීම් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 139(8)අනුව සෑම ගෙවීමක්ම එකෙනෙහිම නියමිත ලේඛනවල සටහන් කරන බව සහ විධිමත් පරිදි ගිණුම්ගත කරන බව ගෙවන නිලධාරියා විසින් සහතික වීමෙන් පසුව ගෙවීම් සිදු කළ යුතු වුවද ඒ පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව අදාළ වියදම් ප්‍රධාන ලෙජරයේ සටහන් කර නොතිබියදී ගෙවීම් කර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයට අදාළ ලෙජර් හා ජර්නල් ආදිය, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව මූල්‍ය ප්‍රකාශන, ලෙජර් හා ජර්නල් සකස් කල යුතු බවත් පූර්ණ කාලීන ගණකාධිකාරිවරයෙකු නොමැති වීම හා ගිණුම් විෂය සම්බන්ධ දැනුමැති නිලධාරියකු නොමැති වීම හේතුවෙන් මෙම ගිණුම් සම්බන්ධ වාර්තා සකස් කිරීමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම ගෙවීමක්ම එකෙනෙහිම නියමිත ලේඛනවල සටහන් කරන බව සහ විධිමත් පරිදි ගිණුම්ගත කරන බව ගෙවන නිලධාරියා විසින් සහතික වීමෙන් පසුව ගෙවීම් සිදු කළ යුතුය. |
| (ඇ) | 2024 වර්ෂය සඳහා අරමුදලේ කාර්යයන් ඉටු කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම සහ අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමණාකරනය කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් හා සේවකයින් අනුමත පරිදි පත් කර අරමුදලේ කාර්යයන් ඉටුකර ගැනීමට මානව සම්පත් කළමණාකරනය විධිමත් පරිදි යොදවා ගෙන නොතිබීම හේතුවෙන් අරමුදලේ අරමුණු ඉටු කිරීම සඳහා විධිමත් සැලැස්මක් සහ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2025 වර්ෂයේදී එම අඩුපාඩු නිවැරදි කර ගනිමින් ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර ඇත. තවද, මෙම අරමුදලේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් මෙම අඩුපාඩු සිදු වී ඇති බැවින් ඉදිරියේදී කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීමට තීරණය කර ඇති බව දන්වා තිබුණි. | අරමුදලේ අරමුණු ඉටු කිරීම සඳහා විධිමත් සැලැස්මක් සහ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරන පනතේ 47 (4) උප වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වුවත්, 2019 වර්ෂයෙන් පසු බුද්ධශාසන අරමුදලේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවසන් ගිණුම සකස් කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇති අතර, මේ වන විට 2020, 2021 අවසන් වාර්තා සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | රාජ්‍ය මූල්‍ය කළමණාකරන පනතේ අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |
| (ආ) | අරමුදලේ 2024 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ පහත සඳහන් දෑ සම්බන්ධයෙන් අනුකූල වන බව දක්වා තිබුණද, එම කරුණු සම්බන්ධයෙන් අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2024 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ අනුකූලතා ලේඛණය අඩුපාඩු සකස් කර සංශෝධනය කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව, සංශෝධිත කෙටුම්පත් වාර්තාව කඩිනමින් ලබා දීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | කාර්යසාධන වාර්තාවේ ආකෘතිය අනුව නිවැරදි තොරතුරු ඇතුළත් කර වාර්තාව පිළියෙල කළ යුතු වීම. |
| | (i) මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර ඇති බවට අනුකූල වන බව | | |
| | (ii) ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යන බව | | |
| | (iii) මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම යන්නට අනුකූල වන බව | | |
| | (iv) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් අනුකූල වන බව දක්වා තිබුණද,<br>2024 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | | |
| | (v) වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කර ඇති බව. | | |

| | | | |
|---|---|---|---|
| | (vi) වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බව<br><br>(vii) නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව.<br><br>(viii) ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට ඇති බව.<br><br>(ix) අංක 1/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බව.<br><br>(x) අංක 1/2017 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර ඇති බව. | | |
| (ඇ) | 2024 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ කාර්යසාධන දර්ශක යටතේ බුද්ධශාසන අරමුදලේ කාර්යසාධන දර්ශක සඳහන් කර නොතිබුණි. | 2024 සංශෝධිත කෙටුම්පත් වාර්ෂික වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | කාර්යසාධන වාර්තාවේ ආකෘතිය අනුව නිවැරදි තොරතුරු ඇතුළත් කර වාර්තාව පිළියෙල කළ යුතු වීම. |
| (ඈ) | 2015 ජූලි 07 වෙනි දින පවත්වා තිබූ බුද්ධශාසන අරමුදලේ 74 වන පාලක මණ්ඩල රැස්වීම මඟින් අරමුදල සඳහා නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගෙන තිබුණි. එසේ වුවද, 2024 වසරේ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ 06 | 2024 සංශෝධිත කෙටුම්පත් වාර්ෂික වාර්තාව නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | කාර්යසාධන වාර්තාවේ ආකෘතිය අනුව නිවැරදි තොරතුරු ඇතුළත් කර වාර්තාව පිළියෙල කළ යුතු වීම. |

පරිච්ඡේදයේ 6.1 - සේවක සංඛ්‍යා කළමණාකරනය යටතේ අනුමත සේවක සංඛ්‍යාව නිලධාරීන් 08 දෙනෙකු බව දක්වා තිබුණි. ඒ අනුව, කෙටුම්පත් වාර්ෂික වාර්තාවට ඇතුළත් තොරතුරු නිවැරදි නොවීය.

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත හා ප්‍රකාශිත මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව කිසියම් අරමුදලක පාලන අධිකාරිය විසින් වාර්ෂිකව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය එම අරමුදලේ අරමුණට අනුකූලව පිළියෙල කර අදාල අමාත්‍යංශයේ ලේකම්වරයාගේ සහ ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30ට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු වේ. එසේ වුවද, අරමුදලේ සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම 2024 මැයි 22 දින සිදු කර තිබූ අතර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2025 වසරේ අයවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශය මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට යොමු කර ඇති බව දන්වා තිබුණි. | අදාළ මුදල් රෙගුලාසිය ප්‍රකාරව අයවැය ලේඛනය අනුමත කර ගත යුතු වීම. |